ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

පෙර පාසල් අධ්‍යාපනය පිළිබඳ සහතික පත්‍ර වැඩ සටහන

පළමු සමාසික අවසාන පරීක්ෂණය 2006/2007

භාෂා කුසලතා වර්ධනය - **ESC 1123/1134**

කාලය පැය දෙකයි.

---

දිනය - 2006.10.22 වේලාව - පෙ.ව.10.00 - මධ්‍යාහ්න 12.00 දක්වා

---

එක කොටසකින් ප්‍රශ්න දෙක බැගින් තෝරාගෙන ප්‍රශ්න හතරකට (04) පමණක් පිළිතුරු සපයන්න.

## පළමුවන කොටස

01. (අ) වයස අවුරුදු 3 සිට 5 දක්වා ළමයින්ගේ අවධානයෙන් සවන්දීමේ කුසලතා වැඩි දියුණු කිරීමේ වාසි 2 ක් දක්වන්න.

(ආ) අවධානයෙන් සවන්දීමේ කුසලතාව වැඩි දියුණු කිරීම සඳහා පංති කාමරයේ ඔබ විසින් සැලසුම් කරන ක්‍රියාකාරකම් 2 ක් විස්තර කරන්න.

(ඇ) ඉන් එක් ක්‍රියාකාරකමක් තෝරාගෙන එය ළමුන් සමග අත්හදා බලන ආකාරය පියවරෙන් පියවර විස්තර කරන්න.

02. (අ) පහත සඳහන් මාතෘකාවලින් 3 ක් තෝරාගෙන එමගින් පෙර පාසල් වියේ ළමයින්ගේ කථනය හා වාග්මාලාව සංවර්ධනය කළ හැකි අන්දම පැහැදිලි කරන්න.

- ළමා කවි ගී සිංදු
- නිදහස් කතා බහ
- පිංතූර කාඩ් පත්
- ළමා රංගන
- සෙල්ලම් කඩකයක්

(ආ) කථනය මැනවින් සංවර්ධනය නොවීම නිසා ළමයකුගේ සමාජ වර්ධනයේ ඇතිවිය හැකි බාධා දක්වන්න.

03. (අ) පෙර කියවීම් දක්ෂතා යනුවෙන් අදහස් කරන්නේ කුමක්දැයි පැහැදිලි කරන්න.

(ආ) එම දක්ෂතා ප්‍රගුණ කිරීම සඳහා ඔබ සංවිධානය කරන ක්‍රියාකාරකම් 4 ක්, අවශ්‍ය තැන්හි රූප සටහන් යොදා ගනිමින් පැහැදිලි කරන්න.

## දෙවන කොටස

04. - දෘශ්‍ය විභේදන දක්ෂතා
- ශ්‍රවණ විභේදන දක්ෂතා
- තේරවිලි ගී
- සරල උපදෙස් පිළිපැදීම

යන මේවායින් 3 ක් තෝරාගෙන ඒවා වයස අවුරුදු 4-5 අතර ළමයින්ගේ පෙර කියවීමේ දක්ෂතා ප්‍රගුණ කිරීම සඳහා ප්‍රයෝජනවත් වන ආකාරය පැහැදිලි කරන්න. (අදාල තැන්හි රූප සටහන් දක්වන්න.)

05. පහත සඳහන් කරුණු හතර කියවන්න. ඒවා එකින් එක උපයෝගී කර ගනිමින් සැලසුම් කරන ක්‍රියාකාරකම් පෙර ලිවීමේ දක්ෂතා වර්ධනයට ඉවහල් වන ආකාරය දක්වන්න.

1. සරල කැබලි ප්‍රහේලිකා
2. කුරුටු ගෑම
3. කිරි මැටි /ක්ලේ
4. ඇමිණීම

රූප සටහන් දක්වමින් කරුණු පැහැදිලි කරන්න.

06. පහත සඳහන් මාතෘකාවලින් දෙකක් ගැන විස්තරාත්මක සටහන් ලියන්න.

මාතෘකා 1

ළමයින්ගේ භාෂා දක්ෂතා සංවර්ධනය කෙරෙහි පහත සඳහන් සාධකවල බලපෑම

- ක්‍රීඩා හා ක්‍රියාකාරකම්
- නිවසේ පරිසරය
- කායික වර්ධනය

මාතෘකා 2

ළමයින්ගේ ලිවීමේ දක්ෂතා සංවර්ධනය කිරීමේදී

- ඇස හා අත සමායෝජනය
- විවිධ රටා මතකයේ තබා ගැනීම වැදගත් වන ආකාරය

මාතෘකා 3

ළමයින්ගේ සවන්දීමේ කුසලතා සංවර්ධනයට පංති කාමරයෙන් පිටත දී යොදාගත හැකි ක්‍රියාකාරකම් 3 ක් නම් කරන්න.

එම ක්‍රියාකාරකම් ළමයින් සමග අත්හදා බලන ආකාරය විස්තර කරන්න.

- හිමිකම් ඇවිරිණි. -